**කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------------**

**1 .** **මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 24 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 24 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------------**

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි අක්කර 238.5 ක වපසරියකින් යුතු සුසාන භූමි 59 ක වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) රු.23,311,116 ක්වූ සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 නොවැම්බර් මාසයේදී සභාවට ලබාදී තිබුණු ගැල්වනයිස් බට 648 ක වටිනාකම වූ රු.717,428 ක් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුර නැගුම ව්‍යාපෘතිය මගින් ලබාදී තිබුණු එකතුව රු.35,451,716 ක්වූ ගොඩනැගිලි සහ අනෙකුත් උපකරණවල වටිනාකම ස්ථාවර වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**02.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,061,626 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,453,108 ක් විය.

**2.2.** **ආදායම් පරිපාලනය**

**2.2.1** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු රු.500,000 ක්වූ මුද්දර ගාස්තු ආදායම අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) උසාවි දඩ මුදල් ලේඛනයට අනුව 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලැබියයුතු රු.450,145 ක්වූ උසාවි දඩ ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,410,491 ක්වූ ගෙවිය යුතු පාර්ශවයන් කවුරුන්ද යන්න නිශ්චිතව හඳුනානොගත් ණය ශේෂ 04 ක් සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ පිහිටි අක්කර 238.5 ක වපසරියකින් යුත් සුසාන භූමි 59 ක් සම්බන්ධයෙන් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 9 හි යෝජනා හා අංක 02 හි දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සභාව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි .

(ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ඉ) සභාව භාවිත කළ පැරණි කාර්යාල ගොඩනැගිල්ල ලිඛිත ගිවිසුමක් නොමැතිව බාහිර පාර්ශවයකට මාසික කුලී පදනම මත ලබාදී තිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

**නිශ්ක්‍රීය වත්කම්**

**--------------------**

(අ) රු. 170,000 ක්වූ අත්ට්‍රැක්ටරය (හීරෝෆෑන් ) ධාවනය කළ නොහැකිව භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් වූ ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(ආ) සහල් පිටි ආශ්‍රිත බේකරි ආහාර නිෂ්පාදනය ප්‍රචලිත කිරීම සඳහා රු.640,000 ක්වූ යන්ත්‍ර උපකරණ උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2007 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණු අතර, සභාව විසින් එම යන්ත්‍ර වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා 2016 මාර්තු මාසය වනවිටද කටයුතු කර නොතිබුණි.

**04. පද්ධති හා පාලනය**

**-----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය